# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2311/50 - 2022 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2022.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය ප්‍රකාරව සභාපති ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබීම හේතුකොට ගෙන අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන මුනිදාස ගමගේ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත්වන්නා වූ ද, එම අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මලිදුව රාජපක්ෂ ජගත් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදී වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66ආ(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මලිදුව රාජපක්ෂ ජගත්, අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරාපත් කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ටී. ඩබ්ලිව්. පෝෂිතා කෞමදී,**
තේරීම්භාර නිලධාරී,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

EOG 12 - 0296

1A - G 38409 — 16 (2022/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*